01-08-2019

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De mezenod -
ද මැසිනොද් විද්‍යාලය - කඳාන ද මැසිනොද් විද්‍යාලය - කඳාන ද මැසිනොද් විද්‍යාලය - කඳාන ද මැසිනොද්

NEW

# ද මැසිනොද් විද්‍යාලය - කඳාන
# De mezenod college - kandana

43 S I

11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2019 | පැයයි

## චිත්‍ර කලාව - I

❖ සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



1.................................................නමින් හඳුන්වන මෙම නිර්මාණය 2.....................................යුගයට අයත් නිර්මාණයකි. මෙය එකල සොලී රජුගේ අගමෙහෙසිය සිහිවීම පිණිස ගොඩනංවන ලද්දකි. එබැවින් මෙම දේවාලය එකල 3......................................................................................යනුවෙන් හැඳින්වූ බව එහි ඇති ශිලා ලේඛනයේ සඳහන් වේ. මෙහි අභ්‍යන්තර සැලැස්ම අන්තරාලය, 4......................................................... 5 ......................................යන කොටස් තුනකින් සමන්විතය.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

6. ව්‍යුක්ත රූපී හැඩතල සහිත ඉන්ද්‍රනිමිත ශිෂ්ටාචාරයට අයත් මූර්ති නිර්මාණය නම් කරන්න.

.......................................................................................................

7. දකුණු ඉන්දියානු තන්ජාවූර් සිතුවම් ශිල්ප ක්‍රමය භාවිතාකර යුරෝපීය යතාර්ථවාදී හා පෙරදිග සිතුවම් ලක්ෂණ සම්මිශ්‍රණය කරමින් සුදු කුකුළා සහ සුදු අත් ඇති පූජක රුව නමැති සිතුවම් නිර්මාණය කල ශිල්පියා වන්නේ.

.......................................................................................................

8. සේනාධිලංකාර අමාත්‍ය වරයාගේ උපදෙස් මත, හතරවන බුවනෙක බාහු රාජ්‍ය කාලයට අයත්; පැන්හල් ගල නමැති ගල් තලාව මත ඉදිකරන ලද විහාරය කුමක්ද ?..........................................................

Learning Resource Center
R
De Mazenod College
Kandana

|දෙවැනි පිටුව බලන්න

9. උත්තර චෛත්‍ය,අභය ,අබාගිරි, භයාගිරි නමින් හඳුන්වන ධාන්‍යාකාර හැඩයෙන් යුත් ස්තූපය නම්කරන්න.

.......................................................................................................................

10. සිගිරි කාන්තා රූප මගින් දිව්‍ය අප්සරාවන් නිරූපනය වන බව ................................................මහතා ප්‍රකාශ කරන්නේ ඉනෙන් පහල වලාකුළුවලින් වැසී ඇති අයුරින් නිරූපණය කිරීම ත් හා ඔවුන් අත මල් දරා සිටින අයුරින් නිරූපණය කිරීමත්ම ත් යන කරුණු පදනම් කරගෙනය.

- **ප්‍රශ්න අංක 11සිත 15 දක්වා රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න. නිර්මාණයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නම සඳහන් කරන්න.**

A



B



C



D



E



11. ශිව දෙවියන්ගේ මූලාදර්ශයක් යැයි සැලකෙන නිර්මාණය වන්නේ.................................................................

12. ප්‍රක්සි ටෙලස් නම් ශිල්පියා විසින් නිර්මාණය කරන ලද දැනට ග්‍රීසියේ ඔලිම්පියා කෞතුකාගාරයේ තැන්පත්කර ඇති නිර්මාණය වන්නේ .......................................................................................................

13. කඳුලෙන් තෙත්ව ගිය ස්භාවික පෙනුම ලබාගැනීමට ඇස් සඳහා ක්‍රිස්ටල් නමැති පාෂාණ විශේෂයක් භාවිතා කල නිර්මාණය වන්නේ.......................................................................................................

14. ස්වභාවික වාදී මිනිස් ස්වරූපයක බාහිර හා කායික ව්‍යුහයට වඩා අභ්‍යන්තර හැඟීම් නිරූපණය කල හැකි යතාර්ථවාදී ශෛලීය ලක්ෂණ සහිත හැඩතල මෙම මූර්තියෙන් නිරූපණය කරයි..............................................................

15. පොළොන්නරු යුගයට අයත් ලෝහ වාත්තු ක්‍රමය අනුව කරන ලද නිර්මාණයකි.............................................

- **අංක 16 සිට 20 තෙක් ඇති එක්එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා, ඊට යටින් ඉරක් අඳින්න.**

16. අනුරාධ පුර යුගයට අයත් පිළිම අතරින් ධර්ම දේශනා කරන ස්වරූපයක් දැක්වෙන ප්‍රතිමාව වනුයේ
    (I) අව්කන බුද්ධ ප්‍රතිමාවයි
    (II) පන්කුලිය
    (III) සමාධි
    (IV) තොලුවිල

17. පහත සන්දහන් සිතුවම් අතරින් ජාතික කලාභවනේ ප්‍රදර්ශනයට තබා ඇති සිතුවම් සහිත පිළිතුර වන්නේ.
    (I) යකදුරාගේ දියණිය, විරැකියාව, කුඹල් හල, ගඩලාදෙණිය,
    (II) ගඩලාදෙණිය, උළු පෝරණුව, විරැකියාව, පෙරහැර, කුඹල් හල
    (III) පෙරුසෙලමට ඇතුළුවීම, ගඩලාදෙණිය, යකදුරාගේ දියණිය, විරැකියාව
    (IV) පෙරහැර, උළු පෝරණුව, කුඹල් හල, ගඩලාදෙණිය

18. පිකාසෝගේ අවිග්නොන් හී යුවතියෝ සිතුවමින් ප්‍රකාශ කෙරෙනුයේ
    (I) කාන්තාවන් පස්දෙනෙකු පිළිබඳ තොරතුරුය.
    (II) බාසිලෝනා නගරයේ සුන්දර කාන්තාවන් ගැනය.
    (III) සුරූපී කාන්තාවන් අතර සිටින විරූපී කාන්තාවන්ය.
    (IV) අභිසාරිකාවන්ගේ බාහිර ස්වරූපය හා අභ්‍යන්තර බෙදවාචකය ය.

[කුන්වෙනි පිටුව බලන්න

19. ගල් විහාරය සම්බන්ධයෙන් ඇති සාවද්‍ය ප්‍රකාශය වනුයේ

(I) මහායාන කලා ලක්ෂණ ඉස්මතුව පෙනේ

(II) ඒකාංශ කරන ලද ඇඟට නොඇලුණු චීවරයේ රැලි සමාන්තර දිත්ව රේඛා කරණයෙන් යුක්තය.

(III) පොළොන්නරු යුගයට අයත් මෙම විහාරය පැරකුම් රජුවිසින් කරවන ලද්දකි.

(IV) ගලෙහි පහිටි ස්වභාවය අනුව අධිඋන්නත ශිල්ප ක්‍රමයට ප්‍රතිමා සම්පිණ්ඩනය කර ඇත.

20. පහත රට සිතුවම් සම්ප්‍රදායට හා උඩරට සම්ප්‍රදායට අයත් පොදු ලක්ෂණයක් වනුයේ.

(I) පර්යාලොක් රීතින් පෙන්වීමට උත්සහ දැරීමයි

(II) පසුබිම සඳහා අළු, කළු , තදනිල වැනි වර්ණ භාවිතා කිරීමයි .

(III) සමස්ත සංරචනය තුළ පරිමාණය හා පර්යාලෝක ලක්ෂණ රීතීන් නොසැලකීමයි

(IV) සිතුවම් තුළ සමකාලීන අත්දැකීම් හා ද්‍රව්‍ය නිරූපනය් කිරීමට ගත උත්සහයයි.

- **අංක 21 සිට 25 දක්වා තෙක් දී රූපසටහන් කොටස්වලට සමීප සම්බන්ද තාවයක් දක්වන රූපසටහන ඉදිරියෙන් ඇති A, B, C, D, E යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

21.  (......... )  A

22.  (......... )  B

23.  (......... )  C

24.  (......... )  D

25.  (......... )  E

[හතරවෙනි පිටුව බලන්න

- පහත සනදහන් ප්‍රකාශ හරිනම් හරි ලකුණද වැරදිනම් වැරදි ලකුණද අදාළ හිස්තැන මත යොදන්න

26. වෙස්සන්තර ජාතකයේ වෙස්සන්තර රජු ඇලි අතු දන්දීම දැක්වෙන චිත්‍රය මැදවෙල විහාරයේ විශිෂ්ට නිර්මානයක් ලෙස සැලකෙන්නේ ඇතුන්ගේ සජීවී චලන ලක්ෂණ හා රිද්මය නිරූපණය කිරීම හේතුවෙනි. ( )

27. ඉන්දියාවේ මහබලි පුරම් හී ආකාශ ගංගා රෝහනය කැටයමට බොහෝ සෙයින් සමාන ලක්ෂණ රජ පවුල කැටයමේ දක්නට ලැබේ. ( )

28. දළදා මාලිගයේ පත්තිරිප්පුව් නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ දේවේන්ද්‍ර මූලාචාරී නම් ශිල්පියා හටය.මගුල් මඩුව,පත්තිරිප්පුව, විජයොත් පාය, උල්පැන්ගේය, මාලිගා සංකීර්නයටම අයත් ගෘහ නිර්මාණ අංගයන්ය. ( )

29. හුණු බිත්තිය මනා ලෙස සකස්කර ප්‍රෙස්කෝ සිකෝ ක්‍රමයට එනමල් වර්ණ භාවිතා කරමින් අගස්තියර් හා විනයාගර් නම් සිතුවම පෙරිය තම්බි සුබ්‍රමනියම් ශිල්පිය විසින් ඉනුවිල් පරරාස සේකර කෝවිලේ නිර්මාණය කරති තිබේ. ( )

30. සුමන දිසානායක සහ වෛතීස්වරම් සිව සුබ්‍රමනියම් සනිදර්ශන සිතුවම් සඳහා දායකත්ව සැපයූ ශිල්පීන්ය. ( )

- අංක **26** සිට **30** තෙක් ඇති වචන වල අර්ථය පැහැදිලි වන් සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

31. අල්පනාව - ..............................................................................

32. ගෝපුර - ..............................................................................

33. ටෙම්පරා - ..............................................................................

34. සම භංග - ..............................................................................

35. ඒ මාර්ක් - ..............................................................................

- පහතින් දී ඇති චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.



36. ශිල්පියා ..............................................................................

37. තේමාව ..............................................................................

38. ආභාෂය ..............................................................................

39. මාධ්‍ය ..............................................................................

40. කලා ලක්ෂණ ..............................................................................

01.08.2019

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De mezenod -
ද මැසිනොද් විද්‍යාලය - කඳාන ද මැසිනොද් විද්‍යාලය - කඳාන ද මැසිනොද් විද්‍යාලය - කඳාන ද මැසිනොද්
mezenod college - kandana mezenod college - kandana mezenod college - kandana mezenod college

NEW

# ද මැසිනොද් විද්‍යාලය - කඳාන
## De mezenod college - kandana

| 43 | S | III |
|---|---|---|

11 ශ්‍රේණිය

දෙවන වාර පරීක්ෂණය - 2019

පැය දෙකයි

## චිත්‍ර කලාව - III

**සැලකිය යුතුය.**

- ඔබේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය පැහැදිලිව උත්තර පත්‍රයේ පසු පිටේ ඉහළ වම් කෙළවරේ ලියන්න.
- උත්තර පත්‍රය ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතුය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම, ඔබට අවාසිදායක විය හැකිය.
- දිය සායම්, පෝස්ටර් සායම්, ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යක් වර්ණ කිරීම සඳහා භාවිතා කළ හැක.

"අ" හෝ "ආ" කොටස්වලින් එකක් තෝරා ගන්න.

### <u>"අ" කොටස - චිත්‍ර සම්පිණ්ඩනය</u>

➢ **පහත සඳහන් තේමාවන් ගෙන් එකක් තෝරා ගෙන වර්ණවත් චිත්‍රයක් සම්පිණ්ඩනය කරන්න.**

1. ගම්බද පරිසරයක පහිටි නාන තොටුපල
2. ගඟක දිය නාන ඇත්තු.
3. ප්‍රපාතයකට පෙරළී අනතුරකට පත් මගී බස් රථයක්.
4. ක්‍රීඩා තරගයක උද්වේගී කර අවස්ථාවක්.
5. රාත්‍රී කාලයේ ගම හරහා ගමන් කරන ආගමික පෙරහැරක්.
6. පහත සඳහන් කවියේ අර්ථය නිරූපණය වන සේ වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

*දිවියත් මරණයත් මැද තරගයක මරු*
*සමගින් සටන් සිදු දිය මත කෙරෙති සරු*
*සිය බඩ වියත රැක දෙන්නට පුරුදු කෙරු*
*හිමිදිරි පාන්දර දියබට ඇදෙති ඔරු*

Learning Resource Centre
R
De Mazenod College
Kandana

නැතහොත්

### <u>"ආ" කොටස - මෝස්තර හා සැරසිලි නිර්මාණය</u>

➢ **පහත සඳහන් මාතෘකාවන්ගෙන් එකක් තෝරා ගෙන වර්ණ මෝස්තරයක් නිර්මාණය කරන්න.**

7. වෙළඳ පොළට නිකුත් කිරීමට නියමිත නුව කිරිපිටි වර්ගයක් සඳහා උස අඟල් 8 ක් හා පළල අඟල් 6 ක් වූ ඇසුරුමක ඉදිරි පෙනුම නිර්මාණය කරන්න.(කිරිපිටි වර්ගය සඳහා සුදුසු නමක් යොදන්න.)
8. වද (සපත්තු මල) මල් කොළ ඇසුරු කරගෙන මේස රෙද්දක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
9. ලේඛකයෙකු විසින් රචිත පාරමී පාරිශ පුද සිරිත නම් වූ ග්‍රන්ථය සඳහා සුදුසු පිටකවරයක් නිර්මාණය කරන්න.
10. ජ්‍යාමිතික හැඩ ඇසුරෙන් ඇඳ ඇතිරිල්ලකට සුදුසු මෝස්තරයක්.
11. වසංගතයක් වන ඩෙංගු උණ රෝගය පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම සඳහා වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
12. බතික් සම්ප්‍රදායට අනුකූල ව නිම කෙරෙන පතාකයක් සැලසුම් කරන්න.
13. නව නිවසක ජනේලයකට සුදුසු නිර්මාණාත්මක ග්‍රිල් සැලැස්මක් ( එක වර්ණයකින් මතුසර දක්වන්න)